**ශීර්ෂය 163 - අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශිර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයිම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටුකිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරීයා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 163 - අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියලු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ලේඛන හා පොත් පවත්වා නොතිබීම.<br>2. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.9<br>2.1.1 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අනුකූල නොවීම්<br>2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.10<br>2.11 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අලුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම.<br>2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3.2.1<br>2.3 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ | 1. වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම<br>2. පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස | 2.4 (ආ)<br>2.4(ඇ) |

| | | | | |
|---|---|---|---|---|
| | උද්ගත වී ඇති සියලු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | | පරිහරණය කිරීම. | |
| | | 3. | මහජනයා සඳහා සේවා ඉටුකිරීමේ අඩුපාඩු | 2.5 |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | | පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු | 2.8 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව. | 1. | සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.6 (අ) |
| | | 2. | අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2.6 (ආ) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.7 |

| | | | |
|---|---|---|---|
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරි භාරයක් වීම. | පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම | 2.4(ඇ) |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------

**2.1 කාර්යසාධනය**

-----------------

**2.1.1 සැලැසුම් කිරිම**

-----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සමඟ යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 කාර්යයන් ඉටු නොකිරීම**

---------------------------

**අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---------------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද හා සමාලෝචිත වර්ෂයේදීම සම්පූර්ණයෙන් නිම කිරීමට අපේක්ෂා කරන ලද අංගම්පොර ගම්මානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය, පානීය ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු යන ක්‍රියාකාරකම් 03 හි භෞතික ප්‍රගතිය සියයට 10 සිට 50 දක්වා දුර්වල මට්ටමක පැවතුණි. එම ව්‍යාපෘති

සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා වූ වාර්ෂික ප්‍රතිපාදනයෙන් සියයට 75 කට වඩා වැඩි ප්‍රමාණයක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර තිබුණි.

(ආ) 2011 වර්ෂයේදී සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ තුළ ඉදිකිරීම් අංශයක් පිහිටුවා තිබුණි. මධ්‍යස්ථාන ඉදිකිරීම් හා නඩත්තු කටයුතු එම අංශය මගින් සිදුකරනු ලබයි. 1998 වර්ෂයේ සිට 2018 අප්‍රේල් 20 වනවිට ඉදිකර විවෘත කර තිබූ සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව 182 ක් වූ අතර සංස්කෘතික මධ්‍යස්ථාන 34 ක් ඉදිකරමින් පැවතුණි. 2017 දෙසැම්බර් 31 දින වනවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 110 ක සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි. තවද සංස්කෘතික මධ්‍යස්ථාන 07 ක් ඉදිකිරීම් ආරම්භ කර අතරමග නවතා තිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේදී පැන නැගී ඇති ඉඩම් ආරවුල්, ඉඩම් නායයෑම් වැනි හේතුන් මත මධ්‍යස්ථාන 06 ක් ඉදිකිරීම් ආරම්භ කර අතරමැද නවතා දමා තිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට ඒ සඳහා රු.මිලියන 19.08 ක් වැය කර තිබුණි. සමන්තුරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ රු.මිලියන 2.27 ක් වැයකර ඉදිකර තිබූ සංස්කෘතික මධ්‍යස්ථානය දිස්ත්‍රික් ලේකම්ගේ ඉල්ලීම අනුව ජංගම අධිකරණයක් සඳහා ලබාදී තිබුණි.

(ඈ) අමාත්‍යාංශය විසින් රු.144,790,238 ක් වැයකර ඉදිකර තිබූ සංස්කෘතික මධ්‍යස්ථාන 13 ක් ඉදිකිරීම් කටයුතු නිමකර වසර 04 ක් ගතවී තිබුණද 2018 අගෝස්තු වන විටත් විවෘත කර නොතිබුණි.

**මාර්ග සංවර්ධන ව්‍යාපෘති**

වයඹ සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2017 වර්ෂය තුළදී සිදු කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය අනුව රු.මිලියන 20.7 වටිනාකමක ව්‍යාපෘති 03 ක් අවිච්ඡේද වී තිබුණි. 2018 සැප්තැම්බර් 30 දින වනවිට ඒ අතුරින් එක් ව්‍යාපෘතියක භෞතික ප්‍රගතිය සියයට 70 ක් පමණ වූ අතර අනෙක් ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය සියයට 100 ක් විය.

(ආ) ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති යටතේ 2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය ඇස්තමේන්තු වටිනාකම රු. 12,003,205 ක ව්‍යාපෘති 10 ක් අවලංගු කර තිබූ අතර රු.837,521 ක් වටිනා කුඩා නගර ව්‍යාපෘති 01 ක්ද අවලංගු කර තිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු. මිලියන 734.74 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 566.20 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. එහෙත් ගොඩනැගිලි ඉදිකිරීම් වැය විෂයය යටතේ රු.මිලියන 659 ක් ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් එයින් රු.මිලියන 166 ක් උපයෝජනය නොකර ඉතිරිව පැවති අතර එය සලසා තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 25 ක් විය.

**2.4 වත්කම් කළමනාකරණය**

**(අ) වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

2002 පෙබරවාරි 25 දිනැති අංක 1/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර අමාත්‍යාංශයට අයත් වාහන 68 හි රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

මුදල් රෙගුලාසි 1647 (අ) ප්‍රකාරව අමාත්‍යාංශය සතු වාහනවලට අදාළව සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

දිවයින පුරා පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන 166 ක තක්සේරු වටිනාකම රු.400,283,087 ක් වූ අතර එම ඉඩම්වල අයිතිය 2017 දෙසැම්බර් 31 දින වනවිටත් අමාත්‍යාංශයට පවරාගෙන නොතිබුණි.

**2.5 කළමනාකරණ දුර්වලතා**

**මහජනතාව සඳහා සේවා ඉටු කිරීම**

2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 ප්‍රකාරව සියළුම රාජ්‍ය ආයතන විසින් තම ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය හඳුන්වා දී ක්‍රියාත්මක කළ යුතු වුවද එවැන්නක් පිළිබඳ අමාත්‍යාංශය දැනුවත්ව නොතිබුණු අතර චක්‍රලේඛයේ ඇතුළත් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.6 කාර්යභාරයන් ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු මූලධන ප්‍රතිපාදනය හා උපයෝජනය පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 2013 | පුනරාවර්තන | 634.48 | 562.53 | 71.95 | 11.33 |
| | මූලධන | 529.40 | 473.68 | 55.72 | 10.52 |
| | **එකතුව** | **1,163.88** | **1,036.21** | **127.67** | |
| 2014 | පුනරාවර්තන | 658.64 | 649.80 | 8.84 | 1.34 |
| | මූලධන | 663.70 | 377.95 | 285.75 | 43.05 |
| | **එකතුව** | **1,322.34** | **1,027.75** | **294.59** | |
| 2015 | පුනරාවර්තන | 889.20 | 820.48 | 68.72 | 7.72 |
| | මූලධන | 3,523.74 | 503.64 | 3,020.10 | 85.70 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **එකතුව** | **4,412.94** | **1,324.12** | **3,088.82** | |
| 2016 | පුනරාවර්තන | 853.01 | 827.08 | 25.93 | 3.03 |
| | මූලධන | 4,286.34 | 2,035.39 | 2,250.95 | 52.51 |
| | **එකතුව** | **5,139.35** | **2,862.47** | **2,276.88** | |
| 2017 | පුනරාවර්තන | 941.46 | 886.02 | 55.44 | 5.88 |
| | මූලධන | 4,109.25 | 2,701.00 | 1,408.25 | 34.27 |
| | **එකතුව** | **5,050.71** | **3,587.02** | **1,463.69** | |

පසුගිය වසර 05 ක සලසා තිබුණු මූලධන ප්‍රතිපාදනවලින් සැලකිය යුතු ප්‍රමාණයක් වාර්ෂිකව උපයෝජනය නොවී පවතින වාතාවරණයක් උක්ත විග්‍රහයට අනුව නිරීක්ෂණය විය. එහිදී ද වැඩිම ප්‍රතිපාදන ඉතිරිය 2015 වර්ෂයේදී නිරීක්ෂණය විය.

ඊට අමතරව සමාලෝචිත වර්ෂයේ සලසා තිබුණු ප්‍රතිපාදනවල උපයෝජන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

මූලධන වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 26.25 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

මූලධන වැය විෂයයන් 04 ක් සඳහා එකතුව රු.මිලියන 1,006.25 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 294.66 පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය, සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 52 ක සිට සියයට 87 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 2.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 16301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 38 | 43.87 | 23. | 32.03 | 120 | 98.50 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.
විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 1,422,145 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ට වැඩි දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්,එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට අමාත්‍යාංශය අපොහොසත් වි තිබුණි.

## 2.8 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 66.45 ක් විය. එම ශේෂ තුළ වූ වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.1,224,592 ක්වූ තැන්පතු 05 ක් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.9 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) | පවත්වා නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලින කර පවත්වා නොතිබුණි. |

## 2.10 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 104 (1) (අ) | 1,578,336 | සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ දෙකකට අවස්ථා 03 කදී අනතුරු සිදු වී තිබුණු අතර සම්පූර්ණ අලාභය හා අනතුරට හේතු නිශ්චය වශයෙන් දැනගැනීමත් එයට වගකිවයුත්තන් නිශ්චය කිරීම සඳහාත් පරීක්ෂණ සිදුකර නොතිබුණි. අනතුරු 02 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වූ බව දන්වා ඇතත් එය තහවුරු කිරීමට අදාළ පරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ) 2015 ජුනි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | | |
| 2 වන ඡේදය | | උක්ත චක්‍රලේඛයේ 2 ඡේදය අනුව නිකුත් කළ |

| | | | |
|---|---|---|---|
| | | | දින සිට මාස 03 ක් ඇතුළත වාහන අපහරණය කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ වගකීම බව දක්වා තිබුණද අපහරණය කිරීමට හඳුනා ගන්නා ලද වාහන 06 ක් 2017 දෙසැම්බර් 22 වන විටද අපහරණය කර නොතිබුණි. |
| | 5 වන ඡේදය | | එම චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාරව අපහරණය කිරීමට නියමිත වාහන තක්සේරු කර ඒවායේ අවම මිල නියම කිරීමට 2017 දෙසැම්බර් 22 දින දක්වාම කමිටුවක් පත්කර නොතිබුණි. |
| **2.11** මානව සම්පත් කළමනාකරණය | (ඇ) 2016 සැප්තැම්බර් 19 දිනැති අංක 1/2016 දරන චක්‍රලේඛයේ 2 ඡේදය සහ 2016 මාර්තු 17 දිනැති අංක 01/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 04 ඡේදය | 2,637,295 | යොමුගත චක්‍රලේඛ පරිදි මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ, විවිධ කාණ්ඩයන්වල නිලධාරීන්ට අනුයුක්ත කිරීම පිණිස සහ වාහන සංචිත සඳහා පමණක් වාහන ලබාගත හැකි වේ. නමුත් කල්බදු පදනම යටතේ ලබාගත් වාහනයක් නියෝජ්‍ය අමාත්‍යවරයාගේ භාවිතය සඳහා යොදවා 2017 ජනවාරි සිට 2018 මැයි දක්වා කාලපරිච්ඡේදය සඳහා රු.2,637,295 ක් ගෙවා තිබුණි. |

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 547.31 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.457,233 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 26 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 06 | 05 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 659 | 542 | 117 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 587 | 511 | 76 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | - | 113 | - |
| | එකතුව | 1,281 | 1,197 | 197 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

**-------------------------------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද සේවක සංඛ්‍යා ලේඛනයට අනුව සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් 13 ක්ද, සංවර්ධන නිලධාරීන් 18 ක්ද මධ්‍යස්ථාන කාර්යාල කාර්ය සහායක 35 ක්ද පුරප්පාඩු වී තිබියදී සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරියකුද, සංවර්ධන නිලධාරීන් 3 ක්ද, ප්‍රවෘත්ති නිලධාරියකුද, මධ්‍යස්ථාන කාර්ය සහායකයකුද සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ජන සංගීත සංරක්ෂණ මධ්‍යස්ථානයේ සේවයේ යොදවා ඇති අතර එම නිලධාරීන් වෙනුවෙන් 2016 වර්ෂයේදී රු.1,776,842 ක්ද 2017 වර්ෂයේ ඔක්තොම්බර් මාසය දක්වා රු.2,005,082 ක්ද අමාත්‍යාංශයෙන් වැටුප් ගෙවා තිබුණි. එසේම ගාලු උරුමය පදනම වෙත සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් තිදෙනෙකු මුදාහැර තිබූ අතර ඒ සඳහා 2016 වර්ෂයේදී රු.965,387 ක්ද 2017 නොවැම්බර් මාසය දක්වා රු.857,148 ක් වැටුප් ගෙවා තිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

**----------------------------------------------------**

මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් ඡායාරූප ශිල්පියෙකු වසර 06 ක කාලයක සිටද කම්කරුවකු වසර 02 ක කාලයක සිටද අමාත්‍යාංශයේ රාජකාරී සඳහා යොදාගෙන තිබූ අතර එම නිලධාරීන් දෙදෙනාද 2018 ජනවාරි වනවිට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ජන සංගීත සංරක්ෂණ මධ්‍යස්ථානයේ සේවයේ යොදවා තිබුණි.